සෞඛ්‍ය පද්ධතිය ශක්තිමත් කිරීම (එච්එස්එස්) සඳහා එන්නත් හා ප්‍රතිශක්තිකරණය සඳහා වූ ගෝලීය සන්ධානය (ගැවි) වැඩසටහන - 2014

---

සෞඛ්‍ය පද්ධතිය ශක්තිමත් කිරීම (එච්එස්එස්) සඳහා එන්නත් හා ප්‍රතිශක්තිකරණය සඳහා වූ ගෝලීය සන්ධානය (ගැවි) වැඩසටහනේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ එන්නත් හා ප්‍රතිශක්තිකරණය සඳහා වූ ගෝලීය සන්ධානය අතර 2013 ජුනි 19 දින එළඹි මුදල් ප්‍රදාන ගිවිසුමේ 36 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම සහ ව්‍යාපෘති කාලය

---

සෞඛ්‍ය පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා එන්නත් හා ප්‍රතිශක්තිකරණය සඳහා වූ ගෝලීය සන්ධානය වැඩසටහනේ ඉල්ලුම්පත්‍ර ආකෘති (ගැවි) - 2007 ට අනුව, එවකට සෞඛ්‍ය අමාත්‍යාංශය වර්තමානයේ සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මාතෘ හා ළමා සෞඛ්‍ය සේවා ආවරණය සහ තත්ත්වය දියුණු කිරීම මඟින් අඩුසේවා සැපයුම් ප්‍රදේශවල මාතෘ හා ළමා සෞඛ්‍ය සම්බන්ධයෙන් ගිලන්වන හා මරණයට පත් වන සංඛ්‍යාව වේගයෙන් අඩුකිරීම වැඩසටහනේ අරමුණු වේ.

වැඩසටහනේ නිශ්චිත අරමුණු වන්නේ,

(i) 2015 වර්ෂය වන විට ජාතික සම්මතයට ළඟාවීම සඳහා අඩුසේවා සැපයුම් දිස්ත්‍රික් 10 ක යෝග්‍ය කුසලතා සංයෝගයකින් ප්‍රාථමික සෞඛ්‍ය ආරක්ෂණ කාර්ය මණ්ඩලය වැඩිකිරීම.

(ii) 2015 වර්ෂය වනවිට මාතෘ හා ළමා සෞඛ්‍ය සේවා බෙදා හැරීම සඳහා අඩු සේවා සැපයුම් දිස්ත්‍රික් 10 ක ජාතික ප්‍රමිතීන් ඉටුකර ගැනීම සඳහා මූලික යටිතල හා විස්තරාත්මක සැලසුම් ලබාගත හැකි බවට තහවුරු කර ගැනීම.

(iii) 2015 වර්ෂය වනවිට මධ්‍යම මට්ටමේ පහසුකම් කළමනාකරුවන් මඟින් අඩුසේවා සැපයුම් දිස්ත්‍රික් 10 ක මාතෘ හා ළමා සෞඛ්‍ය සේවා ප්‍රමාණවත් නියාමනය හා අධීක්ෂණය සිදුකරන ලද බවට තහවුරු කර ගැනීම.

එන්නත් හා ප්‍රතිශක්තිකරණ සඳහා ගෝලීය සන්ධාන (එච්එස්එස්) වැඩසටහනේ ඉල්ලුම්පත්‍ර - ආකෘති 2007 අනුව, වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 516.7 කට සමාන එජඩොලර් මිලියන 4.51 ක් වන අතර, එන්නත් හා ප්‍රතිශක්තිකරණය සඳහා ගෝලීය සන්ධානය විසින් මුළු මුදලම මූල්‍යයනය කිරීමට එකඟ වී තිබුණි. වැඩසටහන එහි කටයුතු 2008 ජනවාරි 01 දින ආරම්භ කරන ලද අතර 2012 දෙසැම්බර් 31 වන විට නිමකිරීමට සැලසුම් කර තිබුණි. පසුව වැඩසටහන් කාල පරිච්ඡේදය 2015 දෙසැම්බර් 31 දක්වා අවස්ථා 3 කදී දීර්ඝ කර තිබුණි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

--------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

1.4 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.
මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල වැඩසටහන් කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ වැඩසටහනේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම වැඩසටහන විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ප්‍රදානය කරනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද වැඩසටහන් වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් වැඩසටහනේ ප්‍රගතිය, වැඩසටහනේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ප්‍රදාන යටතේ

කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ප්‍රදාන යටතේ ආපසු ගැනීම් මුදල් ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ වැඩසටහනේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ) එන්නත් හා ප්‍රතිශක්තිකරණය සඳහා වූ ගෝලීය සන්ධාන ඉල්ලුම්පත්‍ර ආකෘති - 2007 හි දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණේද යන බව.

1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

------------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

----------------

2.1 මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම හැර, මාගේ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2014 දෙසැම්බර් 31 දිනට වැඩසටහනේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව සහ

(ඈ) එන්නත් හා ප්‍රතිශක්තිකරණය සඳහා වූ ගෝලීය සන්ධාන ඉල්ලුම්පත්‍ර ආකෘති - 2007 හි දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්
------------------------------------------

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මෙහෙයුම් කාර්යයන්, ආයෝජන කාර්යයන් හා මූල්‍ය කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහ හෙළිදරව් කිරීමට හැකිවන පරිදි වැඩසටහනේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කර නොතිබුණි. ඊට අමතරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කර නොතිබුණි.

(ආ) වැඩසටහන් නියාමන කාර්යයන් සඳහා දරන ලද රු.204,240 ක්වූ පුනරාවර්තන පිරිවැය, ලිබඩු හා උපකරණ යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි.

2.2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම
------------------------------------------------

වැඩසටහනේ මුදල් ප්‍රදාන ගිවිසුමේ 30 සහ 34 ඡේදය යටතේ අභ්‍යන්තර විගණන කාර්යයන් සිදුකළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ එළඹි ගනුදෙනු සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන කාර්යයන් සිදුකර නොතිබුණි.

3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය
----------------------------------------

3.1 අරමුදල් උපයෝජනය
----------------------------

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2014 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ප්‍රදාන ගිවිසුමේ මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | **2014** දෙසැම්බර් **31** දිනට | |
| | එ.ජ.ඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එ.ජ.ඩො මිලියන | රු.මිලියන | එ.ජ.ඩො මිලියන | රු.මිලියන |
| එන්නත් සහ ප්‍රතිශක්තිකරණය සඳහා ගෝලීය සන්ධානය | 4.5 | 516.7 | 150.0 | 1.0 | 107.9 | 4.0 | 489.2 |
| ශ්‍රී ලං ර | - | - | 7.0 | 0.1 | 6.2 | 0.1 | 6.2 |
| එකතුව | 4.5 | 516.7 | 157.0 | 1.1 | 114.1 | 4.1 | 495.4 |

## 3.2 භෞතික ප්‍රගතිය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නිශ්චිත වැඩසටහන් කාලපරිච්ඡේදය තුල වැඩසටහනේ අරමුණු ඉටුකරගැනීම තහවුරු කර ගැනීම සඳහා මූල්‍ය හා භෞතික වශයෙන් මතුකර දක්වමින් මාසිකව, කාර්තුමය, අර්ධ වාර්ෂික ආදී වශයෙන් සමස්ත වැඩසටහනේ කාලපරිච්ඡේදය ආවරණය වන පරිදි පරිපූර්ණ විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් තිබිය යුතු වුවත් එවැනි සැලැස්මක් පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල රු.7,155,214 ක පිරිවැයකට ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කරන ලද කාර්යයන් 08 කින් කාර්යයන් 03 ක් පිළිබඳ ආරම්භක ක්‍රියාමාර්ගයන් ගෙන තිබූ අතර ඒ සඳහා එකතුව රු.1,426,302 ක අත්තිකාරම් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (සැලසුම්) පවුල් සෞඛ්‍ය කාර්යාංශය හා ත්‍රිකුණාමලයේ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත ගෙවා තිබුණි. කෙසේ වුවද එක් කාර්යයක් හෝ සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) ඊට අමතරව, සමාලෝචිත වර්ෂය තුළ වැඩසටහනේ වෙනත් කාර්යයන් 03 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.381,132 ක මුදලක් වෙන්කර තිබූ අතර ඉන් රු.149,845 ක් පමණක් 2014 දෙසැම්බර් 31 දින වන විට දරා තිබුණි. එම කාර්යයන් පිළිබඳ අරමුදල් උපයෝජනය හා භෞතික ප්‍රගතිය පිළිවෙලින් සියයට 23 සිට සියයට 56 දක්වා හා සියයට 40 සිට සියයට 53 දක්වා විය.

(ඈ) ලැබුණු සාක්ෂි අනුව, වවුනියා ග්‍රාමෝදය සෞඛ්‍ය මධ්‍යස්ථානයේ පුනරුත්ථාපන කාර්යයන් 02 ක් අරමුදල් ඌනතාවය හේතුවෙන් සැලසුම් කළ පරිදි සිදු කර නොතිබුණු අතර වවුනියාවේ ළිං 3 ක් ගැඹුරු කිරීමේ වෙනත් කාර්යයක් ප්‍රදේශයේ පැවති ජලගැල්ම හේතුවෙන් අත්හැර තිබුණි.

3.3 මූල්‍ය පාලනය පිළිබඳ කරුණු

--------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු.170,973,209 ක පිරිවැයකට වැඩසටහන විසින් ප්‍රසම්පාදනය කරන ලද ස්ථාවර වත්කම් සටහන් කිරීමට ස්ථාවර වත්කම් ලේඛනයක් වැඩසටහන විසින් නඩත්තු කර නොතිබුණි.

(ආ) 2012 වර්ෂයේ සිට වැඩසටහන විසින් ප්‍රසම්පාදනය කරන ලද වත්කම් පිළිබඳ භාණ්ඩ සමීක්ෂණයක් කර නොතිබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස 2014 දෙසැම්බර් 31 දිනට එම වත්කම්වල භෞතික පැවැත්ම විගණනයේදී නිශ්චය කළ නොහැකි විය.